කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
DEPARTMENT OF METEOROLOGY

383, බෞද්ධාලෝක මාවත කොළඹ 07, ශ්‍රී ලංකාව | 383, பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு 07, இலங்கை | 383, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka

තද සුළං සහ රළු මුහුදු

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
ස්වාභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය

රතු • ක්‍රියාත්මක වන්න


නිකුත් කළේ	වලංගු වන්නේ (සිට)	වලංගු වන්නේ (දක්වා)	නිවේදන අංකය
13 නොවැම්බර් 2026 05:00 PM	**14 නොවැම්බර් 2026** 05:30 AM	**15 නොවැම්බර් 2026** 05:30 AM	**MSA/26/11/13/01-SI**

⚠ ගිනිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ යාත්‍රා කරන බහුදින ධීවර යාත්‍රා සහ කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය, පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන්වන මුහුදු ප්‍රදේශ සඳහා.

ගිනිකොනදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් නිර්මාණය වී ඇත. මෙම පද්ධතිය වයඹ දෙසට ගමන් කරමින්, නොවැම්බර් 15 වැනිදා පමණ වන විට 'පීඩන අවපාතයක්' දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත. ඉන් අනතුරුව තවදුරටත් මෙම පද්ධතිය උතුරට බරව වයඹ දෙසට ගමන් කරමින්, නොවැම්බර් මස 16 වැනිදා පමණ වන විට මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව සුළි කුණාටුවක් බවට වර්ධනය වීමට හැකියාව පවතී.

එමනිසා, 2026 නොවැම්බර් 14 දින උදෑසන 05.30 සිට, උතුරු අක්ෂාංශ 05ත් 15ත් සහ නැගෙනහිර දේශාංශ 80ත් 90ත් අතර මුහුදු ප්‍රදේශවල සහ කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ පොතුවිල් හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ. එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.



මෙම පද්ධතිය සම්බන්ධ මීළඟ නිවේදනය නොවැම්බර් 14 දින සවස 05.00ට නිකුත් කරනු ලැබේ.

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
කාලගුණවිද්‍යාඥ: Malith Fernando
0112686686

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
DEPARTMENT OF METEOROLOGY

383, බෞද්ධාලෝක මාවත කොළඹ 07, ශ්‍රී ලංකාව | 383, பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு 07, இலங்கை | 383, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka

STRONG WINDS AND ROUGH SEAS

Department of Meteorology
Natural Hazards Early Warning Centre

Red • TAKE ACTION


Issued at	Valid From	Valid Until	Bulletin No
13 November 2026 05:00 pm	**14 November 2026** 05:30 am	**15 November 2026** 05:30 am	**MSA/26/11/13/01-EN**

⚠ For Multi-day boats in the Southeast Bay of Bengal deep sea areas and the sea areas off the coast extending from Kankasanthurai to Hambantota via Trincomalee and Pottuvil.

A low-pressure area has formed over the southeastern Bay of Bengal. It is very likely to move northwestwards and intensify into a depression over the same region around 15th November 2026. Thereafter, it is likely to move north-northwestwards and intensify further into a cyclonic storm over the central Bay of Bengal around 16th November.

Therefore, Naval and fishing communities are warned not to venture to the deep-sea areas bounded by 05N-15N and 80E-90E, and the sea areas off the coast extending from Kankasanthurai to Hambanthota via Trincomalee and Pottuvil, from 5.30am on 14 November 2026 until further notice. Further, Naval and fishing communities operating in those sea areas are advised to move to safe areas.

The naval and fishing communities, are requested to be attentive to the future forecasts and bulletins issued by the Department of Meteorology in this regard.



The next bulletin will be issued at 05.00pm on 14 November 2026

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
Duty Meteorologist: Malith Fernando
0112686686